| 2003 - වාහන | 1,627,000 | 1,627,000 | 1,596,212 | 98.11 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | |
| 2102 - ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 6,995,000 | 11,995,000 | 6,989,331 | 58.27 |
| 2103 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 769,000 | 769,000 | 759,319 | 98.74 |
| 2104 - ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 40,142,000 | 35,142,000 | 31,461,667 | 89.53 |
| **හැකියා වර්ධනය** | | | | |
| 2401 - කාර්ය මණ්ඩල පුහුණු | 442,000 | 442,000 | 410,368 | 92.84 |
| **මූලධන වියදම්** | **54,100,000** | **54,100,000** | **45,324,917** | |
| | | | | |
| **පුනරාවර්තන හා මූලධන වියදම්වල මුළු එකතුව** | **295,900,000** | **295,900,000** | **285,357,841** | |

## 3.8. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අනු අංකය | ශීර්ෂ අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන% ලෙස |
|---|---|---|---|---|---|---|---|
| | | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1. | 001 | ජනාධිපති ලේකම් කාර්යාලය | තොරතුරු තාක්ෂණ උද්‍යාන | 3,533,630 | 3,533,630 | 3,533,630 | 100.00 |
| 2. | 020 | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ දීමනා ප්‍රතිපූර්ණය | 1,490,638 | 1,490,638 | 1,490,638 | 100.00 |
| 3. | 051 | ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යංශය | තොරතුරු තාක්ෂණ උද්‍යානය, පාසැල් පරිගණක විද්‍යාගාර සඳහා ගෘහ භාණ්ඩ | 2,940,374 | 2,940,374 | 2,940,374 | 100.00 |
| 4. | 052 | විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යංශය | පුනරාවර්ථන, විද්‍යා මධ්‍යස්ථානය සඳහා කුලී | 221,757 | 221,757 | 221,757 | 100.00 |
| 5. | 101 | බුද්ධ ශාසන, ආගමික කටයුතු සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යංශය | බෞද්ධ විහාරස්ථාන නවීකරණය | 672,068 | 672,068 | 672,068 | 100.00 |
| 6. | 102 | මුදල් අමාත්‍යංශය | ගම්පෙරළිය, ජීවනෝපාය මාර්ග ක්‍රියාකාරකම්, සපිරි ගමක්, RIDP | 294,664,212 | 294,664,212 | 291,939,470 | 99.08 |
| 7. | 104 | ජාතික ප්‍රතිපත්ති ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම සහ පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යංශය | ගම්පෙරළිය, RIDP, නැවත පදිංචි කිරී ම කටයුතු, ලෝක ආහාර වැඩසටහන, DCB | 349,378,144 | 349,378,144 | 349,378,144 | 100.00 |
| 8. | 110 | අධිකරණ අමාත්‍යංශය | සමථකරණය, මාතෝඩ්ඩම් ප්‍රධාන ජල සැපයුම් සම්බන්ධතාවය | 3,780,425 | 3,780,425 | 3,143,271 | 83.15 |
| 9. | 116 | වෙළඳ අමාත්‍යංශය | වැටුප් සහ වෙනත් | 179,456 | 179,456 | 181,236 | 100.99 |
| 10. | 118 | කෘෂිකර්ම අමාත්‍යංශය | වැටුප් සහ වෙනත් | 2,600,165 | 2,600,165 | 2,600,165 | 100.00 |
| 11. | 120 | කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යංශය | ප්‍රවාහන දීමනා සහ ලිපි ද්‍රව්‍ය, සනීපාරක්ෂක භාණ්ඩ, ගැබිණි මවුවරුන් සඳහා පෝෂණ ආහාර පැකේජය | 35,118,085 | 35,118,085 | 35,118,085 | 100.00 |
| 12. | 122 | ඉඩම් අමාත්‍යංශය | වැටුප් සහ වෙනත් දීමනා | 251,940 | 251,940 | 250,740 | 99.52 |
| 13. | 124 | සමාජ සවිබල ගැන්වීමේ සහ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යංශය | ආබාධිත පුරවැසි දීමනා, වැඩිහිටි දීමනා, CKD දීමනා | 110,406,020 | 110,406,020 | 110,406,020 | 100.00 |
| 14. | 130 | රාජ්‍ය සේවා, | නියං ආධාර, ගංවතුර ආධාර, සුළි සුළං | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | ආධාර, පුහුණුවන උපාධිධාරීන්ගේ දීමනා | 43,598,970 | 43,598,970 | 43,031,158 | 98.70 |
| 15. | 149 | කර්මාන්ත අමාත්‍යාංශය | පුහුණු වැඩසටහන | 18,393 | 18,393 | 18,393 | 100.00 |
| 16. | 151 | ධීවර කටයුතු අමාත්‍යාංශය | දියවර පියස | 2,044,125 | 2,044,125 | 1,247,002 | 61.00 |
| 17. | 155 | රාජ්‍ය පරිපාලන, අභ්‍යන්තර කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | වැටුප් සහ වෙනත් | 57,014,479 | 57,014,479 | 57,014,479 | 100.00 |
| 18. | 157 | ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | ONUR ව්‍යාපෘතිය, REESP ව්‍යාපෘතිය, වැටුප් සහ වෙනත් | 27,919,158 | 27,919,158 | 27,919,158 | 100.00 |
| 19. | 159 | සංචාරක කටයුතු අමාත්‍යාංශය | කුන්චුකුලම් එල්ලෙන පාලම අලුත්වැඩියාව - තේක්කම් | 1,299,952 | 1,299,952 | 1,299,952 | 100.00 |
| 20. | 193 | කම්කරු අමාත්‍යාංශය | ඵලදායිතා සංවර්ධන නිලධාරී සඳහා ගමන් වියදම් දීමනා සහ පුහුණුවීමේ සහතිකපත් | 327,350 | 327,350 | 299,941 | 91.63 |
| 21. | 194 | ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය | වැටුප් සහ වෙනත්, යෞවනයින් සවිබල ගැන්වීමේ වැඩසටහන්, ස්මාර්ට් ශ්‍රී ලංකා, යන්ත්‍රෝපකරණ, විදුලිය සහ ජලය | 3,970,066 | 3,970,066 | 3,747,191 | 94.39 |
| 22. | 195 | සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳාම් පිළිබඳ අමාත්‍යාංශය | වැටුප් සහ වෙනත් | 400,248 | 400,248 | 400,248 | 100.00 |
| 23. | 198 | වාරිමාර්ග අමාත්‍යාංශය | පුනරාවර්තන | 450,663 | 450,663 | 342,428 | 75.98 |
| 24. | 203 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | මඩු දේවස්ථානයේ අභ්‍යන්තර මාර්ගය වැඩිදියුණු කිරීම | 58,003,000 | 58,003,000 | 57,982,109 | 99.96 |
| 25. | 206 | සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | කලාකරු සවුදම, ජාතික සහ දිස්ත්‍රික් සංස්කෘතික උත්සව, අවශ්‍යතා සහිත කලාකරුවන්, දොළොස් මහේ පහන | 810,500 | 810,500 | 751,130 | 92.67 |
| 26. | 210 | තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි පුනරුත්ථාපනය සහ පුනරාවර්ථන | 74,936 | 74,936 | 41,995 | 56.04 |
| 27. | 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | වැටුප් සහ වෙනත්, පුනරුත්ථාපන වැඩසටහන් | 1,972,882 | 1,972,882 | 1,959,119 | 99.30 |
| 28. | 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා | නිවුන් දීමනා, රැස්වීම්, ලිපිද්‍රව්‍ය සහ ප්‍රවාහන | 260,046 | 260,046 | 259,293 | 99.71 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | දෙපාර්තමේන්තුව | දීමනා | | | | |
| 29. | 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | ඔලිම්පික් වැඩසටහන, ක්‍රීඩා ශක්ති | 2,389,018 | 2,389,018 | 2,328,765 | 97.48 |
| 30. | 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | වැටුප් සහ වෙනත් | 5,041,657 | 5,041,657 | 5,027,417 | 99.72 |
| 31. | 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | කෝවිඩ් 19 | 5,483,643 | 5,483,643 | 5,233,739 | 95.44 |
| 32. | 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | ගබඩා කාමරය | 21,683,605 | 21,683,605 | 19,826,445 | 91.44 |
| 33. | 252 | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | HIES සංගණනය, වෙනත් පුනරාවර්තන | 1,014,870 | 1,014,870 | 956,001 | 94.20 |
| 34. | 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | විශ්‍රාම වැටුප් | 21,291,252 | 21,291,252 | 21,083,732 | 99.03 |
| 35. | 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | රෙජිස්ට්‍රාර් දීමනා | 600,355 | 600,355 | 600,355 | 100.00 |
| 36. | 286 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | වැටුප් සහ වෙනත් | 292,530 | 292,530 | 234,788 | 80.26 |
| 37. | 307 | මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | පුනරාවර්තන | 911,696 | 911,696 | 881,974 | 96.74 |
| 38. | 326 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | ලිපිද්‍රව්‍ය | 3,000 | 3,000 | 3,000 | 100.00 |
| 39. | 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත් ති සැලසුම් දෙපාර්තමේන්තුව | පුනරාවර්ථන, තරුණ ව්‍යවසායකත්ව වැඩසටහනේ සම්මුඛ පරීක්ෂණ වියදම් ආවරණය, ගමන් වියදම් | 478,505 | 478,505 | 473,707 | 99.00 |
| 40. | 328 | මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | ප්‍රවාහන දීමනා සහ දැනුවත් කිරීමේ වැඩසටහන් | 297,036 | 297,036 | 272,802 | 91.84 |
| 41. | 334 | බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව | වැටුප් සහ වෙනත් | 3,116,025 | 3,116,025 | 3,065,183 | 98.37 |
| 42. | 402 | ග්‍රාමීය සහ පාසැල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යංශය | අනෙකුත් සැපයුම් | 66,490 | 66,490 | 65,090 | 97.89 |
| 43. | 403 | කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යංශය | ප්‍රවාහන දීමනා සහ ලිපි ද්‍රව්‍ය, සනීපාරක්ෂක භාණ්ඩ, ගැබිණි මවුවරුන් සඳහා පෝෂණ ආහාර පැකේජය | 10,711,656 | 10,711,656 | 10,271,769 | 95.89 |
| 44. | 408 | වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යංශය | පුනරාවර්ථන, විද්‍යාතා මධ්‍යස්ථානය සඳහා කුලී | 274,110 | 274,110 | 235,352 | 85.86 |
| 45. | 409 | රාජ්‍ය ආරක්ෂක, ස්වදේ ශ කටයුතු හා ආපදා | නියං ආධාර ගංවතුර ආධාර, සුළි සුළං ආධාර, වායු සමීකරණ යන්ත්‍රය මිලදී ගැනීම, | 39,082,916 | 39,082,916 | 35,781,066 | 91.55 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය | මාන්තෛයි බටහිර ප්‍රදේශීය ලේකම් කාර්යාලය සඳහා නව මූර්තන (imaging) ඒකකයක් මිලදී ගැනීම | | | | |
| 46. | 412 | විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය | වැටුප් සහ වෙනත් | 1,131,240 | 1,131,240 | 1,070,005 | 94.59 |
| 47. | 414 | සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | තනි දෙමාපිය සංවර්ධනය, ගෙවතු, CKD දීමනා, ආබාධිත පුරවැසි දීමනා, වැඩිහිටි දීමනා | 48,098,320 | 48,098,320 | 48,094,717 | 99.99 |
| 48. | 415 | ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | නැවත පදිංචි කිරීමේ කටයුතු | 138,805,144 | 138,805,144 | 135,698,371 | 97.76 |
| 49. | 421 | නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය | පුහුණු වැඩසටහන් | 53,325 | 53,325 | 38,405 | 72.02 |
| 50. | 425 | වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ලූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය | වැටුප් සහ වෙනත් | 1,335,005 | 1,335,005 | 1,177,172 | 88.18 |
| **එකතුව** | | | | **1,305,563,080** | **1,305,563,080** | **1,290,609,049** | |

## 3.9. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 31-12-2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31-12-2020 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| **9151** | ගොඩනැගිලි සහ ව්‍යූහයන් | 360,731,146 | 360,731,146 | - | - |
| **9152** | යන්ත්‍රෝපකරණ | 189,854,740 | 189,854,740 | - | - |
| **9153** | ඉඩම් | 1,750,000 | 1,750,000 | - | - |
| **9154** | අස්පෘශ්‍ය වත්කම් | 0 | 0 | - | - |
| **9155** | ජීව විද්‍යාත්මක වත්කම් | 0 | 0 | - | - |
| **9160** | කරිගෙන යන වැඩ | 56,615,996 | 56,615,996 | - | - |
| **9180** | බදු දෙන ලද වත්කම් | 0 | 0 | - | - |
| එකතුව | | **608,951,882** | **608,951,882** | - | - |

## 3.10. විගණකාධිපතිවරයාගේ වාර්තාව

<u>සිංහල පරිවර්තනය</u>

# ජාතික විගණන කාර්යාලය

මගේ අංකය - NNP/MN/A/DSMN/02/20 ඔබ අංකය - දිනය - 2021 ජූනි 21

දිස්ත්‍රික් ලේකම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

මන්නාරම

**මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව <u>විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව</u>**

ඉහත වාර්තාව සහ විගණනයට යොදා ගන්නා ලද මූල්‍ය තත්ව ප්‍රකාශනයන් මේ සමඟ ඉදිරිපත් කර ඇත.

අත්සන

ඒ.ජේ.එල්. විමලරත්න

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත් - 1. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

2. ලේකම්, අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය - තලවතුගොඩ

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව

+94 11 2 88 70 28 - 34

# ජාතික විගණන කාර්යාලය

මගේ අංකය - NNP/MN/A/DSMN/02/20 ඔ බ අංකය - දිනය - 2021 ජූනි 21

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මන්නාරම

**මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දින අදාලව මූල්‍ය තත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, එම මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණනයේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමත් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මා විශ්වාසය කරමි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලවත් 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වන වගන්තියෙහි සඳහන් විධිවිධානයන්ට අනුකූලවත් සත්‍ය හා සාධාරණ තත්වයන් පිළිබිඹුකෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම එවන් වංචාවන් ඇතිවීමට හේතුවේ.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් තොරව අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ පැහැදිලි කිරීමක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බවට ඇගයීම් කරන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 <u>වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් ලබාදෙන ලද පහත සඳහන් කර ඇති උපදෙස් ක්‍රියාවට නංවා නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණ | උපදෙස් |
|---|---|---|
| 2.2 | හඳුනාගන්නා ලද චක්පත් 19 රු. 1,371,155 | පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |
| 3.1.3 (අ) | දීර්ඝ කාලයක් තිස්සේ අවතැන්ව සිටින සිංහල සහ මුස්ලිම් ජනතාව සඳහා වන යටිතල පහසුකම් ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද පෙර පාසැල් ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ හිමිකම වෙනස් කිරීම. | සුදුසු පියවර ගත යුතුය. |
| 3.1.3 (ආ) | වැඩ අවසන් කර නොමැති කොරලි මෝට්ටේ මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | ගිවිසුම ප්‍රකාරව සුදුසු පියවර ගත යුතුය. |
| 3.3 | රු. 151,600,000 ක වටිනාකමින් යුක්තව ඉදිකරන ලද නිවාස 208 ක් භාවිතයට යොදවා නොගැනීම. | සුදුසු පරීක්ෂණයක් පවත්වා භාවිතයට ගැනීම සඳහා පියවර ගත යුතුය. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

#### 1.6.1.1 අත්තිකාරම් ගෙවීම

ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 09 වන වගන්තියේ ප්‍රකාරව සේව යන් ඉවත් කළ සහ සේවය අතැර ගොස් සිටින නිලධාරීන් සිව් දෙනකුගේ හිඟ ණය ශේෂයෙහි එකතුව වන රු. 334,572 ක මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොමැත.

1.6.2 මූල්‍ය තත්ව ප්‍රකාශනය

**1.6.2.1 තැන්පතු ගිණුම් ශේෂයන්**

**කල් ඉකුත්වූ ඇප තැන්පතු**

පහත නිරීක්ෂණයන් සිදුකෙරෙනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රඳවාගෙන තිබෙන එකතුව රු 1,585,834ක් වන ගිණුම් 20 ක පවතිනඇප තැන්පතු මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව පියවර ගෙන කටයුතු කිරීමෙන් තොරව ගතවූ වසර දෙකකට අධික කාලයක් තිස්සේ පොදු තැන්පතු ගිණුමෙහි රඳවා තබාගෙන ඇත.

(ආ) භාණ්ඩාගාරයෙහි අවසන් ගිණුම් ප්‍රකාශනය ප්‍රකාරව පෙන්නුම් කර ඇති ශේෂයත් දෙපාර්තමේන්තුව මගින් සකස් කර ඇති තැන්පතු ගිණුම් සම්බන්ධ වාර්තාවෙහි ශේෂයත් අතර එක් තැන්පතු ගිණුමක සංඛ්‍යාත්මක ශේෂ එකතුවෙහි රු. 5,375 ක විෂමතාවයක් නිරීක්ෂණය වේ.

(ඇ) 2002 වර්ෂයේ අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනතට අනුව එකතු කළ අගය මත බදු එළැඹෙන මාසයේ 20 වන දින හෝ එයට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බැර කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකුට ගෙවිය යුතු රු. 425,752 ක් වන එකතු කළ අගය මත බදු මුදල අවිනිශ්චිත ශේෂයක් ලෙස බදු තැන්පතු ගිණුම්වල සඳහන් කර ඇති බව නිරීක්ෂණය විය.

1.6.3 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

**1.6.3.1 මෙහෙයුම් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවූ මූල්‍ය ප්‍රවාහය**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි සහ සේවා දීමනා ලෙස රු. 239,461,330 ක් පෙන්නුම් කර තිබුණි. කෙසේ වුවද පුද්ගල පඩිනඩි සහ සේවා දීමනාවන්නේ රු. 244,254,079 කි. සේවා දීමනාවන්හි මුළු එකතුවේ රු. 4,792,749 ක විෂමතාවයක් නිරීක්ෂණය විය.

**1.6.3.2 ප්‍රාග්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවූ මූල්‍ය ප්‍රවාහය**

2020 දෙසැම්බර් මස 31 දිනට අදාලව ඉදිරිපත් කර තිබූ ජංගම නොවන වත්කම් ලේඛනයේ මූල්‍යමය නොවන වත්කම් ප්‍රසම්පාදනය සහ නිර්මාණය සඳහා රු. 40,715,063 ක් පෙන්නුම් කර තිබුණද මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ ප්‍රාග්ධන ක්‍රියාකාරකම් මත මූල්‍ය ප්‍රවාහයේ ප්‍රාග්ධන වැය ප්‍රතිපාදනයේ වැය කර ඇති මුළු ප්‍රමාණය රු. 45,324,917 ක් ලෙස සඳහන් කර ඇති බැවින් රු. 4,609,854 ක විෂමතාවයක් නිරීක්ෂණය විය.

1.6.5 ලේඛන සහ පොත්පත් පවත්වාගෙන නොයෑම

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් පහත ලේඛන පවත්වාගෙන ගොස් නොමැති බව විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

| අංකය | ලේඛන වර්ගය | නියමිත ප්‍රතිපාදනය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වාගෙන ගොස් නැත |
| (අ) | ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණ ඇගයීම් කමිටු සාමාජිකයින්ගේ පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 | පවත්වාගෙන ගොස් නැත |

## 2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

2019 දෙසැම්බර් මාසයේදී අතැති බිල්පත් ලේඛනයන්ට ගෙවීම් කිරීම සඳහා රු. 250,658,453 ක අග්‍රිම ඉල්ලුම් කොට තිබුණද 2020 වර්ෂයේදී ඇතැම් අමාත්‍යාංශවල නම් වෙනස් කිරීම හේතුවෙන් සම්පූර්ණ ප්‍රතිපාදන නොලද නිසා රු. 85,917,125 ක අග්‍රිම පමණක් ලැබී තිබුණි. ඒ අනුව ඉල්ලුම් කරන ලද අග්‍රිම සහ ලැබුණු අග්‍රිම අතර වෙනස රු. 164,741,328 ක් විය. එම නිසා 2019 වර්ෂයේදී අවසන් කරන ලද ව්‍යාපෘති 769 ක් සඳහා රු. 164,916,826 ක මුදලක් අතැති බිල්පත් ලේඛනයන්ට අනුව ගෙවිය යුතු විය.

2.2 වියදම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැය ශීර්ෂ 04 කට අදාලව එකතුව රු. 9,184,061 ක් ලෙස සියයට 7 සිට සියයට 22 දක්වා ඉතිරිවී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) වැය කේතයන් 07 ක් සඳහා ප්‍රතිපාදන ලෙස වෙන් කරන ලද රු. 74,892,000 ක මුදලකින් සියයට 09 ක් හෙවත් රු. 7,026,000 ක මුදලක් වෙන්කරන ලද අපේක්ෂිත අවශ්‍යතාවයන් සඳහා යොදා නාගෙන වනත් කේතයන් 06 කට මාරු කර ඇත. මේ තුලින් ඇස්තමේන්තු සකස් කිරීමේ අකාර්යක්ෂමතාවයක් පෙන්නුම් කරයි.

(ඇ) වැය කේතයන් 05 ක් යටතේ ඇස්තමේන්තුගත කරන ලද රු. 17,121,000 ක මුදලක් එම තේකයන් සඳහා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සියයට 40 කට අධික ප්‍රමාණයක් හෙවත් රු. 6,875,000 ක් වෙනත් වැය කේතයන් 07 කට වෙන් කර තිබූ ප්‍රතිපාදන හුවමාරු කර ලබාගෙන තිබුණි.

2.3 වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන භාවිතය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2020 වර්ෂයේ පිරිවැය වාර්තාවට අනුව වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් ප්‍රාග්ධන වැය විෂයයන් 14 ක් යටතේ ලබාදී තිබූ ප්‍රතිපාදන නියමිත පරිදි භාවිතයට නොගැනීම හේතුවෙන් එම ප්‍රතිපාදනයන්ගෙන් සියයට 9.68 සිට සියයට 100 දක්වා ප්‍රමාණවලින් මුළු එකතුව ලෙස රු. 10,734,527 ක මුදලක් ඉතිරිව තිබුණි.

(ආ) 2019 වර්ෂයේදී සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන ව්‍යාපෘතියට අදාලව ප්‍රතිලාභීන් 87 දෙනකුට කුකුල් කූඩු සකස් කර ගැනීම සඳහා වන ඇස්තමේන්තු මුසලි ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික සහකාර විසින් සකස් කර තිබුණද, රු. 3,914,565 ක වියදමින් ඉදිකරන ලද මෙම ප්‍රතිලාභීන්ගේ කුකුල් කූඩුවල වැඩ අවසන් කිරීමේ වාර්තාව (Completion Report) නොමැති වීම නිසා මෙම කූඩු සම්බන්ධ කටයුතුවල ගුණාත්මකභාවය තහවුරු කළ නොහැකිව ඇත.

**2.4**නීතිරීති සහ සීමාවන්ටඅනනුකූල වීම

| අං. නීතිරීති සහ සීමාවන් | වටිනාකම (රු.) | අනනුකූලතාවය |
|---|---|---|
| **(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| **i.** 2016 දෙසැම්බර් මස 28 දිනැති අංක 30/2016 දරණ චක්‍රලේඛයේ 3.1 වගන්තිය | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 04 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොමැත. |
| **ii.** 2006 ජූලි මස 14 දිනැති අංක 11/2006 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 173,170 | දිස්ත්‍රික් ලේකම්වරයාට වෙන්කර තිබූ වාහනයට මුළු එකතුව රු. 173,170 ක ඉන්ධන අත්තිකාරම් මුදලක් එම වාහනය භාවිතා නොකරන ශ්‍රේණිවල නිලධාරීන් විසින් ලබාගෙන තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| **i.** 104 (1) | | මුදල් රෙගුලාසීන්ට අනුව නානාට්ටාන් ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ භාවිතයේ පවතින වාහනවල රිය අනතුරුවලට අදාලව දින 07 කට අධික කාලයක් ගතවුවද එම අනතුරට හේතුන් දැනගැනීම සහ වගකීම් පැවරීම සඳහා පරීක්ෂණ පවත්වා නොමැත. |
| **ii.** 104 (2) | | සමාලෝචිත වර්ෂයේදී සිදුවූ රිය අනතුරු දෙකක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවලට අනුව විගණකාධිපතිවරයාට දැනුම්දී නොමැත. |
| **iii.** 104 (3) | | සමාලෝචිත වර්ෂයේදී සිදුවූ රිය අනතුරු දෙකක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවලට අනුව නියමිත කාලසීමාව ඇතුලත මූලික විමර්ශන වාර්තා ඉදිරිපත් කර නොමැත. |

| | | |
|---|---|---|
| **iv.** 108 | 107,207 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍ර දේශීය ලේකම් කාර්යාලවල භාවිතයේ පවතින වාහනවල රිය අනතුරු හේතුවෙන් ඇතිවූ පාඩුවෙහි මුළු එකතුව රු. 107,207 ක් අදාල නිසි අනුමැති ලබාගැනීමෙන් තොරව කපාහැර ඇතුලත් කර තිබුණි. |

**(ඇ) අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු**

<u>චක්‍රලේඛ</u>

| | |
|---|---|
| සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අංක 07/2019 හා 2019-06-20 දිනැති චක්‍රලේඛයේ 04 **(iii)** වගන්තිය | අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබූ ප්‍රතිලාභීන්ගේ තොරතුරු සහ ග්‍රාම සේවා කොට්ඨාශවල කුකුල් කූඩු ඉදිකිරීම සඳහා ද්‍රව්‍ය ප්‍රදානයන් ලද ප්‍රතිලාභීන්ගේ තොරතුරු අතර විෂමතාවයන් නිරීක්ෂණය වන අතර එසේ සංශෝධනය කරන ලද ප්‍රතිලාභීන් 35 දෙනකුගේ තොරතුරු සමෘද්ධි අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කර නොමැත. |

## <u>2.5අවිධිමත් ගනුදෙනු</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ අංක 08/2019 හා 2019 මාර්තු මස 27 වන දිනැති චක්‍රලේඛය අනුව දිස්ත්‍රික් ලේකම්වරයාට සංග්‍රහ දීමනා ලෙස 2019 මැයි මස සිට 2020 අගෝස්තු මාසය දක්වා වන කාලසීමාවට ලබාගත හැක්කේ රු. 221,907 ක මුදලක් පමණක් වුවද එයට අධිකව එම කාලසීමාව තුල සම්පූර්ණ ලෙස රු. 260,119 ක මුදලක් ලබාදී තිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 11/2006 හා 2006 ජූලි මස 14 වන දිනැති චක්‍රලේඛ යේ 3(ix) වගන්තියට පටහැනිව දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2019 ජනවාරි මාසයේ සිට 2020 අගෝස්තු මාසය දක්වා වන කාල පරිච්ඡේදය සඳහා මාසික ප්‍රවාහන දීමනා ලෙස රු. 470,045 ක මුදලක් ලබාගෙන තිබියදී එයට අමතරව රජයේ ඉන්ධන නියෝග යටතේ ඉන්ධන ලීටර 4292 ක් සඳහා රු. 444,875 ක මුදලක්ද ලබාගෙන තිබුණි.

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

### 3.1.1 අපේක්ෂිත නිමැවුම් මට්ටමට ලඟා නොවීම

පහත කරුණු නිරීක්ෂණය විය.

2019 වර්ෂයේදී සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන ව්‍යාපෘතියට අදාලව ප්‍රතිලාභීන් 67 දෙනකු සඳහා කුකුල් කූඩු සකස් කිරීමේ කටයුතු සම්බන්ධව කරන ලද සෘජු භෞතික විගණන පරීක්ෂණයේදී ප්‍රතිලාභීන් 26 දෙනකු නිසි පරිදි කුකුල් කූඩු ඉදිකර නොතිබීමත් කුකුල් කූඩු භාවිතා නොකිරීමත් මත මෙම ව්‍යාපෘතියේ අරමුණු ඉටුවී නොමැති බවත් සමස්ථ මෙහෙයුමෙන් 40% ක් අසාර්ථකවී ඇති බවත් නිරීක්ෂණය කරන ලදී.

### 3.1.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් 2018-04-20 දින ආරම්භ කරන ලද රථ ගාල, තොරතුරු තාක්ෂණ උද්‍යානය සහ ශ්‍රවණාගාරය සඳහා වන තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2020-12-31 දින දක්වා රු. 52,694,249 ක මුදලක් වැය කර තිබුණි. නමුත් මෙම කටයුතු සඳහාවූ 4 වන අදියර සඳහා වන කාලසීමාව අවස්ථා දෙකකදී දීර්ඝ කරන ලදුව 2021-02-28 දින වැඩ අවසන් කළ යුතුව තිබුණද මුළු එකතුව රු. 2,058,715 ක වටිනාකමින් යුත් කාර්යයන් සෘජු පරීක්ෂණ දිනයවූ 2021-04-26 දින දක්වා සම්පූර්ණ කර නොතිබුණි.

### 3.1.3 ව්‍යාපෘති සම්පූර්ණ කිරීමෙන් තොරව අත්හැරීම

රු. මිලියන 10 කට ඇස්තමේන්තුගත කර Abdul Cader Construction නමැති ඉදිකිරීම්කරු විසින් සිදුකරන ලද කොරලිමෝට්ටේ මාර්ගය ඉදිකිරීමේ කටයුතු සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරන ලදී.

(අ) මෙම ව්‍යාපෘතිය 2019 නොවැම්බර් මස 23 වන දිනට අවසන් කළ යුතු වුවද 2021-03-26 වන දින දක්වා එම කටයුතු සම්පූර්ණ කර නොමැති අතර ගිවිසුම කඩ කිරීම සහ අසතුටුදායක කාර්ය සාධනය සඳහා වන කාර්ය සාධක බැඳුම්කරය (Performance Security) කල්ඉකුත්වන දිනය 2020-01-21 විය. අදාල කටයුතු අවසන් කර

නොමැතිවීම නිසා කාර්ය සාධක බැඳුම්කරයේ කල්ඉකුත්වන දිනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දීර්ඝ කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් කාර්ය සාධක බැඳුම්කරයේ වටිනාකමවූ රු. 375,318 ක මුදල ඉදිකිරීම්කරු විසින් ආපසු ලබාගෙන තිබුණි.

(ආ) ඉදිකිරීම්කරු වෙත පළමුවන කොටස ලෙස ගෙවා තිබූ රු. 1,620,000 ක මුදලින් පහත සඳහන් කර ඇති වැඩ සඳහා වන අමුද්‍රව්‍ය සඳහා ගෙවීම් ලෙස රු. 1,193,400 ක මුදලක් ගෙවා ඇති අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ප්‍රසම්පාදනය කරන ලද අමුද්‍රව්‍ය ආරක්ෂා කිරීම සඳහා කාර්යක්ෂම පියවර ගෙන නොතිබුණි.

(ඇ) අමුද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් සොරාගෙන තිබීම සහ අමුද්‍රව්‍ය හානියට පත්ව තිබීම හේතුවෙන් ඉදිකිරීම්කරු විසින් 2020-06-04 දින Mutual Termination සඳහා දිස්ත්‍රික් ලේකම්වරයා වෙත කැමැත්ත පලකර තිබුණද ඒ සම්බන්ධයෙන් පියවර ගෙන නොමැත.

## 3.2 ප්‍රසම්පාදනයන්

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2006 ප්‍රසම්පාදන අත්පොතෙහි 33 වන පරිශිෂ්ඨයේ 2.14.1 වගන්තියට පටහැනිව මුසලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් ටෙන්ඩර් පදනමින් රු. මිලියන 3.9 ක වටිනාකමින් යුත් භාණ්ඩ ප්‍රසම්පාදනය කර තිබුණි.

## 3.3 පාඩු සහ හානි

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අංක NPPC-2432 දරණ වාහනය 2020 වර්ෂයේ මැයි මස 24 වන දින අනතුරකට ලක්ව ඇති අතර එම අනතුර හේතුවෙන් රු. 196,179 ක පාඩුවක් සිදුව ඇත. එම පාඩුවෙන් හානි ලෙස රු. 150,832 ක මුදලක් අදාල රක්ෂණ සමාගමෙන් අයකරගෙන ඇත. එසේ වුවද 2020 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ පාඩු සහ කපාහැරීම් පිළිබඳ වාර්තාවේ පාඩු ලෙස රු. 45,347 ක් පෙන්නුම් කිරීම වෙනුවට රු. 196,179 ක් පෙන්නුම් කර තිබුණි.

## 3.4 බැදීම් සහ වගකීම්

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අංක 2019/07 හා 2020 ජූනි 20 දිනැති චක්‍රලේඛයේ 07 වන වගන්තිය අනුව නිෂ්පාදන සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා නිලධාරීන් මසකට වරක් එක්රැස්වී නිෂ්පාදන සැලසුම් කටයුතු පිළිබඳ ප්‍රගති සමාලෝචනයක් සිදුකර අවශ්‍ය පියවර ගත යුතු වුවද, ඔවුන් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් වගකීම් පැහැර හැර ඇති බව නිරීක්ෂණය විය.

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණය ඉදිරිපත් කරනු ලැබේ.

(අ) පනංකට්ටිකොට්ටු බටහිර (MN/76) මැහුම් පුහුණු මධ්‍යස්ථානයේ තිබූ උපකරණ අස්ථානගතකර තිබීම සම්බන්ධව ආර්ථික සංවර්ධන නිලධාරීන් විසින් 2019-11-26 දින පැමිණිලි කර තිබුණද ප්‍රාදේශීය ලේකම්වරයා විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) මාන්තෙයි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදිය යුතු මැහුම් පුහුණු උපකරණ පුහුණු කටයුතු සඳහා මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදී නොමැති අතර මෙම උපකරණ කුරිංසාක්කුලම් අරුල්මිගු අම්බාරවේල් පිල් ලයාර් දේවස්ථානය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිරිමි නේවාසිකාගාරය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා කළමනාකරණ අංශය වැනි ස්ථානවල තබා ඇත. මෙම මැහුම් පුහුණු උපකරණ ලබාගෙන මැහුම් පුහුණු කටයුතු සිදුකිරීමට මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පියවර ගෙන නොමැති තත්වය සමඟ මැහුම් පුහුණු පාඨමාලාවද අවසන්වී ඇති බව නිරීක්ෂණය කරන ලදී.

(ඇ) තලෙයිමන්නාරම ජැටිය නැගෙනහිර (MN/51) මැහුම් පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු කටයුතු අවසන්ව තිබුණද එම පුහුණු කටයුතු සඳහා යොදාගන්නා ලද මැහුම් යන්ත්‍ර අනාරක්ෂිත ලෙස එම පුහුණු මධ්‍යස්ථානවල තබා ඇති බවට එම ප්‍රදේශයේ ආර්ථික සංවර්ධන නිලධාරී විසින් ප්‍රදේශීය ලේකම්වරයාට වාර්තා කර තිබුණද එම වාර්තාව සම්බන්ධයෙන් ප්‍රදේශීය ලේකම්වරයා විසින් නිසි පියවර ගෙන නොතිබුණි.

(ඇ) ස්වයං රැකියා සහ වෙළඳ අමාත්‍යාංශයේ අංක MIC/SME/TEX/04/01 හා 2016 ජූනි මස 23 දිනැති චක්‍රලේඛයට පටහැනිව මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් මැහුම් පුහුණු මධ්‍යස්ථාන 14 ක මැහුම් පුහුණුව ලැබූවන් හට Single Needle Lock Stitch මැහුම් යන්ත්‍ර බෙදා දී තිබුණි. වර්ග 08 කින් යුත් අනෙකුත් මැහුම් යන්ත්‍ර සහ ඒ සමඟවූ උපකරණ ස්වයං රැකියා ප්‍රවර්ධන අධිකාරියට භාරදී නොතිබූ අතර එම යන්ත්‍ර සහ ඒ සමඟවූ උපකරණ මේ දක්වාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් භාර නොගැනීම හේතුවෙන් ඒවා නිසි නඩත්තුවකින් තොරව පැවතීම, බාහිර පුද්ගලයින්ගේ භාරයේ පැවතීම මෙන්ම අස්ථානගත කිරීමටද ලක්ව තිබේ.

**4. <u>මානව සම්පත් කළමනාකරණය</u>**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුමත සේවක සංඛ්‍යාව 664 ක් ලෙස නිරීක්ෂණය වුවද සමාලෝචිත වර්ෂය අවසානයේදී සේවක පුරප්පාඩු 206 ක් පැවති බව නිරීක්ෂණය විය.

අත්සන
ඒ.ජේ.එල්. විමලරත්න
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

**4. 04 වන පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක**

**4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක**

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තථ්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | **100%-90%** | **75%-89%** | **50%-74%** |
| ඉඩම් බලපත්‍ර | - | - | 51% |
| උප්පැන්න සහතික, මරණ සහතික, විවාහ සහතික | - | 77% | - |
| වාහන ආදායම් බලපත්‍ර | 92% | - | |
| ජාතික හැඳුනුම්පත් | - | - | 62% |
| ව්‍යාපාර ලියාපදිංචිය | - | - | 63% |

**5. 05 වන පරිච්ඡේදය – තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

**5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න**



## සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම

සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම යනු මානව වර්ගයා විසින් මුහුණ දෙනු ලබන එක් විශාලතම අභියෝගයක් ලෙස ඉතිරිව පවතී. වර්ෂ 1990 සිට 2015 දක්වා කාලය තුලදී ලෝකයේ වෙසෙන අන්ත දිළිඳු ජනගහනය සංඛ්‍යාත්මකව හරි අඩකට වඩා පහළ ගියද තවමත් විශාල ජනකායක් ස්වකීය මූලික අවශ්‍යතා සපුරාගත නොහැකිව දුෂ්කරතාවයට පත්ව සිටිති. වර්ෂ 2030 දී සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීමේ අරමුණ සපුරා ගැනීම සඳහා තිරසර සංවර්ධන අරමුණු වෙත විශාල වගකීමක් පැවරී ඇත. මෙහිදී වඩාත් බලපෑමට ලක්විය හැකි පාර්ශව, මූලික පහසුකම් හා සේවාවන් වර්ධනය කිරීම සහ ගැටුම් වලින් හා කාලගුණ තත්ව හේතුවෙන් ඇතිවන විපත් වලින් බලපෑමට ලක්වූ ප්‍රජාව වෙත ආධාර කිරීම කිරීම ඉලක්ක කර ඇත.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| 1 | දිළිදුබව අඩු කිරීම | ජීවන තත්වය නගා සිටුවීම | ගෘහස්ත විදුලි සම්බන්ධතා සඳහා නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන ලබාදීම | - | - | 100% |
| | | ජීවන තත්වයන් වැඩිදියුණු කිරීම සහ මූලික අවශ්‍යතා සපුරාලීම. | දීර්ඝ කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම්, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය මඟින් පවුල් 10 ක් සඳහා ජීවනෝපාය උපකරණ ලබාදීම | - | - | - |
| | | දිළිඳු සහ අනතුරට ලක් වියහැකි අය ප්‍රමාණවත් තරම් ආවරණය වන පරිදි වර්ෂ 2030 වන විට පහළ මට්ටම ඇතුළු සියල්ලන්ම සඳහාම ජාතික මට්ටමින් සුදුසු වන සමාජ ආරක්ෂණ පද්ධතීන් සහ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම. | දීර්ඝ කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම්, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය මඟින් 20 දෙනකු සඳහා රියදුරු බලපත්‍ර සහ ජීවනෝපාය මාර්ග සඳහා ආධාර ලබාදීම | - | - | - |

## නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| 3 GOOD HEALTH | යහපත් සෞඛ්‍ය හා සුභ සාධනය | ගුණාත්මක අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය සහ සුරක්ෂණය සඳහා ප්‍රවේශය | මුදල් අමාත්‍යාංශය මගින් සායන මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම කිරීම | - | - | - |

## පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම

සැමට පරිපූර්ණ ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම මගින් අධ්‍යාපනය යනු තිරසර සංවර්ධනය සඳහා වන වඩාත් බලවත් සහ ප්‍රත්‍යක්ෂ සාධකයක් යන විශ්වාසය නැවත තහවුරුවේ. මෙම ඉලක්කය මගින් වර්ෂ 2030 වන විට සියළුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් සඳහා ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය නොමිලේ ලබාදීම සහතික කෙරේ.

එමෙන්ම වෘත්තීය පුහුණුවීම් සඳහා දැරිය හැකි මුදලකට සමාන ප්‍රවේශයක් ලබාදී ස්ත්‍රී පුරුෂ සහ දුප්පත් පොහොසත් විෂමතා දුරු කර ගුණාත්මක උසස් අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශය ලබාදීම එහිදී ඉලක්ක කෙරේ.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | අධ්‍යාපනික පහසුකම් ගොඩනැගීම සහවැඩිදියුණු කිරිම, පාසල් සිසුන් 35 දෙනකු සඳහා සුදුසු අධ්‍යාපනික පරිසරයක් ලබාදීමට පහසුකම් සැලසීම | ජාතික සමගිය හා සංහිදියා කාර්යංශය මඟින් පාසල් සඳහා කැසිකිලි ඉදිකිරිම සහ පාසල්වල මායිම් වැටවල් සකස් කිරීම. | - | - | - |
| | | යෝග්‍ය අධ්‍යාපනික පරිසරයක් සැපයීම සඳහා අධ්‍යාපනික පහසුකම් ගොඩනැගීම සහ ඉහළ නැංවීම. | ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යංශයේ නැවත පදිංචි කිරීමේ අංශය මගින් ගුරු නිල නිවාස ඉදිකිරිම | - | - | 100% |
| | ගුණාත්මක අධ්‍යාපනය | සෑම සිසුවකු සඳහාම දැරිය හැකි මුදලකට ගුණාත්මක අධ්‍යාපනික යටිතල පහසුකම් සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම. | නැවත පදිංචි කිරීමේ අමාත්‍යංශයමඟින් පාසල් ගොඩනැගිලි ඉදිකිරීම, පන්ති කාමර අළුත්වැඩියා කිරීම කිරීම, යටිතල පහසුකම් වැඩිදියුණු කිරිම | - | - | - |
| | | ළමා, ආබාධිත, ස්ත්‍රී පුරුෂ සංවේදී සහ ආරක්ෂාකාරී, සාමකාමී, පරිපූර්ණ සහ ඵලදායී අධ්‍යාපනික පරිසරයක් සැමට ලබාදීම සඳහා අධ්‍යාපනික පහසුකම් ගොඩනැගීම සහවැඩිදියුණු කිරීම | දීර්ඝ කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යංශය මඟින් පාසල් ගොඩනැගිලි ඉදිකිරීම සහ අළුත්වැඩියා කිරීම, ගෘහ භාණ්ඩ සහ ක්‍රීඩා උපකරණ ලබාදීම - ව්‍යාපෘති 119 යි | - | - | - |
| | | සෑම සිසුවකු සඳහාම දැරිය හැකි මුදලකට ගුණාත්මක අධ්‍යාපනික යටිතල පහසුකම් සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම. | මුදල් අමාත්‍යංශය මගින් පාසැල් සඳහා උපයෝගිතා පහසුකම් ලබාදීම | - | - | 100% |

## සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම

මේ වන විට වැඩිවැඩියෙන් රටවල්ජල ආතතිය අත්විදිමින් සිටින අතර ඉහළ යන නියඟය සහකාන්තාරකරණය හේතුවෙන් මෙම ප්‍රවණතාවය තවත් උග්‍රවී ඇත. වර්ෂ 2030 වන විට ආරක්ෂාකාරී සහ දැරිය හැකි මිලකට සැමට පානීය ජලය ලබාදීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම්, සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සහ සෞඛ්‍යාරක්ෂණ ක්‍රම ප්‍රවර්ධනය සඳහා ආයෝජනය කිරීම අවශ්‍යවේ. ජල ආශ්‍රිත පාරිසරික පද්ධති ආරක්ෂා කිරීම සහ ප්‍රතිශ්ඨාපනය කිරීමද අත්‍යවශ්‍යවේ. ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂාකාරී සහ දැරිය හැකි මිලකට පානීය ජලය ලබාදීම සහතික කිරීමට මූලික අවශ්‍යතාවයන්හි අඩුපාඩු පවතින මිලියන 800 ක ජනතාවක් වෙත ප්‍රවේශ විය යුතු අතරම බිලියන දෙකකට අධික ජනකායකට ආරක්ෂිත ලෙස සේවාවන් වෙත ළඟාවීමට ඇති අවස්ථාව වැඩිදියුණු කළ යුතුය.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%-100% |
| 6 CLEAN WATER AND SANITATION | පිරිසිදු ජලය සහ සනීපාරක්ෂක පහසුකම් | සැමටආරක්ෂාකාරී සහ දැරිය හැකි මිලකට පානීය ජලය සඳහා පොදු සහ සාධාරණ ප්‍රවේශය සැලසීම සාක්ෂාත් කරගැනීම | ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යංශයේ නැවත පදිංචි කිරීමේ අංශය මගින් පෙර පාසැල් සඳහා වැසිකිලි ඉදිකිරිම | - | - | 100% |
| | | ගොවිතැන් කටයුතු සඳහා භූගත ජල ධාරිතාව වැඩිදියුණු කිරීම සහ කුඩා ජලාශවල ජල ධාරිතාවය වැඩි කිරීම | මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යංශය මගින් කුඩා ජලාශ 09 ක් අළුත්වැඩියා කිරීම හෝ ජල ධාරිතාවය වැඩි කිරීම | - | - | - |
| | | සනීපාරක්ෂක පහසුකම් සඳහා ප්‍රමාණවත් සහ සාධාරණ ප්‍රවේශය සැලසීම සාක්ෂාත් කරගැනීම | මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යංශය මගින් වැසිකිලි 05 ක් ඉදිකිරීම | - | - | - |
| | | සැමටආරක්ෂාකාරී සහ දැරිය හැකි මිලකට පානීය ජලය සඳහා පොදු සහසාධාරණ ප්‍රවේශය සැලසීම සාක්ෂාත් කරගැනීම. ප්‍රතිලාභීන් 958 ක් සඳහා ජල පහසුකම් ලබාදීම | ජාතික සමගිය හා සංහිඳියා කාර්යංශය මගින් සාමාන්‍ය විවෘත ළිං 09 ක් ඉදිකිරීම | - | - | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | සෑම අංශයකම ජල පරිහරණ කාර්යක්ෂමතාවය ප්‍රමාණවත් තරම් වර්ධනය කිරීම. ප්‍රතිලාභීන් 650 ක් සඳහා පානීය නල ජල පහසුකම් සැපයීම. | මුදල් අමාත්‍යාංශය මගින් ජල සම්බන්ධතා නවීකරණය කිරීම සහ නව පානීය ජල සම්බන්ධතා ලබාදීම | - | - | 100% |
| | | දූෂණය අඩුකිරීමෙන් ජල ය් ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම. පිරිපහදු කරන ලද පානීය ජලය සැපයීම | ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ නැවත පදිංචි කිරීමේ අංශය මගින් ප්‍රති ආස්‍රැත ජල පෙරහන් පද්ධති සවිකිරීම. | - | - | 100% |
| | | සනීපාරක්ෂක පහසුකම් සඳහා ප්‍රමාණවත් සහ සාධාරණ ප්‍රවේශය සැලසීම සාක්ෂාත් කරගැනීම | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය මගින් සනීපාරක්ෂක පහසුකම් 300 ක් ලබාදීම / වැසිකිලි 300 ක් ඉදිකිරීම | - | - | - |
| | | සැමටආරක්ෂාකාරී සහ දැරිය හැකි මිලකට පානීය ජලය සඳහා පොදු සහසාධාරණ ප්‍රවේශය සැලසීම සාක්ෂාත් කරගැනීම | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය මගින් පුද්ගලික ජල සම්බන්ධතා 864 ක් ලබාදීම | - | - | - |
| | | සෑම අංශයකම ජල පරිහරණ කාර්යක්ෂමතාවය ප්‍රමාණවත් තරම් වර්ධනය කිරීම, තිරසර ඉවත්කර ගැනීම සහතික කිරීම සහ ජල හිගයට පිළියම් ලෙස අභ්‍යන්තර ජලාශවලින් ජලය සැපයීම සහ ජල හිගයෙන් පීඩාවට පත්ව සිටින පුද්ගලයින් සංඛ්‍යාව සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කිරීම. | මුදල් අමාත්‍යාංශය මගින් පොකුණු 01 ක් හා ඇල මාර්ග 06 ක් නවීකරණය සහ ඇල මාර්ග 01 ක් ඉදිකිරීම | - | - | 100% |

**සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම**

ජනගහනය වර්ධනය වීම මේ දක්වාම සිදුවන හෙයින් ලාභදායී බලශක්තිය සඳහා වන ඉල්ලුම සහ ෆොසිල ඉන්ධන මත පදනම්වූ ආර්ථිකයක් පැවතීම හේතුවෙන් අපගේ දේශගුණ තත්වයන්හි ප්‍රභල විපර්යාසයන් නිර්මාණය වෙමින් පවතී. වර්ෂ 2030 වන විට තිරසර සංවර්ධන ඉලක්ක අංක 7 (SDG7) සාක්ෂාත් කරගැනීමටනම්සූර්ය, සුළං සහ තාප බලශක්තිය යනාදිය සඳහා ආයෝජනය, බලශක්ති ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සහ සැමට බලශක්තිය ලැබීම සහතික කිරීම යන කරුණු ඉතා වැදගත්වේ. සෑම රාජ්‍යයකම පිරිසිදු සහ වඩාත් කාර්යක්ෂම බලශක්තිය සැපයීම සඳහා යටිතල පහසුකම් පුළුල් කිරීම සහ තාක්ෂණය උසස් කිරීම මඟින් දියුණුව සඳහා අනුබල දීම සහ පරිසරය සුරැකීම.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| 7 CLEAN ENERGY | දැරිය හැකි, සහ පවිත්‍ර ඉන්ධන | අපගේ අවශ්‍යතා සඳහා වන දැරිය හැකි මිලකට, විශ්වාසනීය සහ නවීන බලශක්ති සේවා වෙත ප්‍රවේශය තහවුරු කිරීම | කර්මාන්ත හා වාණිජ, දීර්ඝ කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම්, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය මඟින් වීදි ලාම්පු 15 ක් සැපයීම | - | - | - |
| | | | මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය මඟින් 359 දෙනකු වෙත විදුලි බල සැපයුම් ලබාදී ඇත. | - | - | - |
| | | සැමට දැරිය හැකි මිලකට, විශ්වාසනීය සහ නවීන බලශක්ති සේවා වෙත ප්‍රවේශය තහවුරු කිරීම | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම්, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින්විදුලි බල ව්‍යාපෘති 13 ක් සම්පූර්ණ කර ඇත. | - | - | - |

## සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම

තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) මඟින් පෝෂිත ආර්ථික වර්ධනය, ඉහළ මට්ටමේ ඵලදායීතාව සහ තාක්ෂණික නව්‍යකරණය ප්‍රවර්ධනය කරයි. මෙහිදී බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීම, වහල් සේවය සහ මිනිස් ජාවාරම දුරුකිරීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම ආදිය මෙන්ම ව්‍යවසායකත්වය සඳහා අනුබල දීම සහ රැකියා උත්පාදනයද වැදගත් වේ. මෙම අරමුණු සිහිතබා ගනිමින් වර්ෂ 2030 වන විට ස්ත්‍රී පුරුෂ සැම අයකුටම සම්පූර්ණ සහ ඵලදායී රැකියාවක් හා යෝග්‍ය කාර්යයන් ලබාදීම සාක්ෂාත් කරගැනීම මෙහි ඉලක්කයයි.

<table>
<tr><th rowspan="2">ඉලක්ක අංකය</th><th rowspan="2">ඉලක්කය / අරමුණ</th><th rowspan="2">ඉලක්ක</th><th rowspan="2">ජයග්‍රහණ දර්ශක</th><th colspan="3">මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය</th></tr>
<tr><th>0% - 49%</th><th>50% - 74%</th><th>75%- 100%</th></tr>
<tr><td rowspan="3"></td><td rowspan="3">යහපත් රැකියා සහ ආර්ථික වර්ධනය</td><td>විශේෂයෙන්ම කාන්තා ගෘහ මූලික පවුල්වල ජීවන තත්වය වැඩිදියුණු කිරීම, කාන්තාවන් සඳහා රැකියා අවස්ථා සහ ආදායම් මාර්ග සලසා දීම, ජනතාවගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීම සහ ඔවුන්ට සතුටුදායක ජීවිතයක් ලබාදීම.</td><td>කර්මාන්ත හා වාණිජ, දීර්ඝ කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම්, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යංශය මඟින් මධ්‍යස්ථාන 15 ක් සඳහා මහන මැෂින් නිකුත් කිරීම - 2019 වර්ෂයේ මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රතිපාදන ලබාදුන් සහ අනුමත ව්‍යාපෘති</td><td>-</td><td>-</td><td>-</td></tr>
<tr><td rowspan="2">තරුණ තරුණියන්, ආබාධිත අයවළුන් ඇතුළු ස්ත්‍රී පුරුෂ සැම අයකුටම සම්පූර්ණ සහ ඵලදායී රැකියාවක් හා යෝග්‍ය කාර්යයන්, සහ සමාන වටිනාකම් ඇති වැඩ සඳහා සමාන ගෙවීම් ලබාදීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම.</td><td>ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම්, උතුරු පලාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යංශය මඟින් වෘත්තීය සහ ජීවනෝපාය මාර්ග ව්‍යාපෘති 6 ක් ක්‍රියාත්මක කිරීම</td><td>-</td><td>-</td><td>-</td></tr>
<tr><td>ඉන්දියාවේ සිට නැවත මෙරටට පැමිණි සරණාගත පවුල් 157 ක් සඳහා නැවත පදිංචි කිරීමේ අමාත්‍යංශය මඟින් නැවත පදිංචි කිරීමේ ආධාර ලබාදීම.</td><td>-</td><td>-</td><td>-</td></tr>
</table>

## සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම

ආර්ථික වර්ධන ය්දී සහ සංවර්ධනයේදී යටිතල පහසුකම් මත ආයෝජනය සහ නව්‍යකරණය යන කරුණු තීරණාත්මක සාධකවේ. මේ වන විට ලෝක ජනගහනයෙන් අඩකට වඩා නගරවල ජීවත් වීමත් සමඟ නව කර්මාන්තයන් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වර්ධනය මෙන්ම මහා පරිමාණයේ ප්‍රවාහනය සහ පුනර්ජනනීය බලශක්තියද වඩාත් වැදගත් වෙමින් පවතී. නව රැකියා අවස්ථා ලබාදීම සහ බලශක්ති ඵලදායීතාවය ප්‍රවර්ධනය ආදී ආර්ථික සහ පාරිසරික යන අභියෝග ද්විත්වය සඳහාම නිත්‍ය විසඳුම් සෙවීමේදී තාක්ෂණික ප්‍රගතියද මූලිකවේ. තිරසර කර්මාන්ත ප්‍රවර්ධනය සහ විද්‍යාත්මක පර්යේෂණ හා නව්‍යකරණයන් සඳහා ආයෝජනය යන සියල්ලක්ම තිරසර සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා වැදගත් වේ.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| 9 | කර්මාන්ත, නව්‍යකරණය සහ යටිතල පහසුකම් | සැමට සමාන සහ දැරිය හැකි මිලකට ප්‍රවේශය කේන්ද්‍රිත ලෙස ආර්ථික සංවර්ධනය සහ මානව යහ පැවැත්මට රුකුලක් වන ප්‍රාදේශීය සහ පරිවාහක යටිතල පහසුකම්ද ඇතුළුව ගුණාත්මක, විශ්වාසනීය, තිරසර සහ සවිමත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම්, උතුරු පලාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින්යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් 06 ක් සම්පූර්ණ කිරීම | - | - | - |
| | | වෙනත් කරුණු අතර කාර්මික විවිධාංගීකරණය සහ පාරිභෝගික භාණ්ඩ සඳහා අගය එකතු කිරීම සහතික කෙරෙන සංවර්ධක ප්‍රතිපත්තිමය රාමුවක් තුළ දේශීය තාක්ෂණය සංවර්ධනය, සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් තුළ පර්යේෂණ සහ නවෝත්පාදන සඳහා සහය වීම | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම්, උතුරු පලාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින් ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති 58 ක් සම්පූර්ණ කිරීම (ප්‍රජා ශාලා, ආගමික ස්ථාන සහ ක්‍රීඩා පිටි) | - | - | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | වර්ෂ 2020 වන විට ඌණ සංවර්ධිත රාජ්‍යයන් සඳහා ගෝලීය සහ දැරිය හැකි මිලකට අන්තර්ජාල ප්‍රවේශ පහසුකම් සැපයීමට කැපවීම සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ප්‍රවේශය සැළකිය යුතු තරම් ඉහළ නැංවීම. | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම, උතුරු පලාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යංශය මඟින් සමිති 144 ක් සඳහා ගෘහ භාණ්ඩ සහ උපකරණ ලබාදීම. | - | - | - |
| | | මාර්ගයන් වෙත පහසු ප්‍රවේශය වැඩිදියුණු කිරීම. | මුදල් අමාත්‍යංශය මගින් අභ්‍යන්තර මාර්ග 120 ක් නවීකරණය සහ මාර්ග 123 ක්, බෝක්කු 8 ක් සහ අපජල මාර්ග 15ක් ඉදිකිරීම. | - | - | 100% |
| | | | ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යංශයේ නැවත පදිංචි කිරීමේ අංශය මගින් මාර්ග 03 ක්, මංතීරු 01 ක්, බෝක්කු 1 ක් සහ අපජල මාර්ග 04 ක් ඉදිකිරීම. | - | - | 100% |
| | | ආර්ථික සංවර්ධනය, මානව යහ පැවැත්ම සහ සැමට සමාන අවස්ථා සැලසීමට රැකුලක් ලෙස ගුණාත්මක, විශ්වාසනීය, තිරසර සහසවිමත් ලෙස යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | මුදල් අමාත්‍යංශය මගින් ගබඩා පහසුකම් 08 ක් සහ සතිපොල ගොඩනැගිල්ලක් නවීකරණය කිරීම. | - | - | 100% |
| | | ග්‍රාමීය ප්‍රදේශ වෙත යහපත් ප්‍රවාහන පහසුකම් ලබාදීම මඟින් කුඩා පරිමාණයේ කර්මාන්ත සහ අනෙකුත් ව්‍යවසායන් සඳහා අවශ්‍ය සම්බන්ධතා වැඩිදියුණු කර දීම සහ ප්‍රධාන මාර්ගයක සිට කිලෝ මීටර 2 ක දුරක් ඇතුලත ජීවත් වන ග්‍රාමීය ජනගහනයේ ප්‍රමාණය ඉහළ නැංවීම. | බුද්ධ ශාසන, සංස්කෘතික කටයුතු සහ ආගමික කටයුතු අමාත්‍යංශය මගින් අභ්‍යන්තර මාර්ග නවීකරණය | - | - | 100% |
| | | සංවර්ධනය වන රටවල්වල තිරසර හා සවිමත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම. | ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යංශයේ නැවත පදිංචි කිරීමේ අංශය මගින් ප්‍රජා ශාලාවක් ඉදිකිරීම. | - | - | 100% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | ආර්ථික සංවර්ධනය, මානව යහපැවැත්ම සහ සැමට සම ප්‍රවේශය සඳහා ගුණාත්මක, විශ්වසනීය, තිරසර සහ නම්‍යශීලී ලෙස යටිතල පහසුකම් සංවර්ධනය | ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යංශයේ නැවත පදිංචි කිරීමේ අංශය මගින් කරදිය බැහැර කිරීමේ බැමි නවීකරණය. | - | - | 100% |
| | | ආර්ථික සංවර්ධනය සහ මානව යහ පැවැත්මට රුකුලක් වන ප්‍රාදේශීය සහ පරිවාහක යටිතල පහසුකම්ද ඇතුළුව ගුණාත්මක, විශ්වාසනීය, තිරසර සහ සවිමත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | සංචාරක සංවර්ධන අමාත්‍යංශය මගින් කිලෝමීටර 6.0 ක අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම | - | - | - |
| | | ආර්ථික සංවර්ධනයට රුකුලක් වන ප්‍රාදේශීය සහ පරිවාහක යටිතල පහසුකම්ද ඇතුළුව ගුණාත්මක, විශ්වාසනීය, තිරසර සහ සවිමත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | කර්මාන්ත හා වාණිජ, දීර්ඝ කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම්, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යංශය මගින් අභ්‍යන්තර මාර්ග, ආගමික ස්ථාන සහ පොදු ශාලා 178 ක ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු කිරීම | - | - | - |
| | | ප්‍රාදේශීය සහ පරිවාහක යටිතල පහසුකම්ද ඇතුළුව ගුණාත්මක, විශ්වාසනීය, තිරසර සහ සවිමත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | මුදල් අමාත්‍යංශය මගින් මාර්ග 37 ක් ඉදිකිරීම - RIDP | - | - | 100% |
| | | ආර්ථික සංවර්ධනය, මානව යහ පැවැත්ම සහ සැමට සමාන ප්‍රවේශය සඳහා රුකුලක් වන ලෙස ගුණාත්මක, විශ්වාසනීය, තිරසර සහ සවිමත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යංශයේ නැවත පදිංචි කිරීමේ අංශය මගින් නැවුම් පලතුරු බීම නිශ්පාදන මධ්‍යස්ථානයක් ඉදිකිරීම. | - | - | 100% |

## රටවල් තුල සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම

ආදායම් විශමතාවය මෑත දශකවලදී සෑම ප්‍රදේශයකම පාහේ විවිධ වේගයන් ගත් වර්ධනයවී ඇත. මෙකී පුළුල් වන විෂමතාවය දුරලීමට අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ භාවය හෝ වාර්ගිකත්වය නොතකා සියල්ලන්ම ඇතුලත් වන ආර්ථිකයක් ප්‍රවර්ධනය කිරීම සඳහා වන ස්ථිර ප්‍රතිපත්ති අවශ්‍යවේ. එමෙන්ම ආදායම් විශමතාවය දුරලීම සඳහා ගෝලීය විසඳුම් අවශ්‍ය වන අතර එහිදී මූල්‍ය වෙළඳපල හා මූල්‍ය ආයතනයන් නියාමනය සහ ආවේක්ෂණය වැඩිදියුණු කිරීම, සංවර්ධන ආධාර සඳහා අනුබල දීම හා වැඩි අවශ්‍යතාවයක් ඇති ප්‍රදේශ වෙත සෘජු විදේශීය ආයෝජන යොමු කිරීම ආදිය සම්බන්ධවේ. පුළුල් වමින් පවතින මෙම අසමානතාවය දුරලීම සඳහා ආරක්ෂාකාරී සංක්‍රමණයට සහ මිනිස් සංචරණයට පහසුකම් සැලසීම වැදගත්වේ.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%-100% |
| | අසමානතාවය අඩු කිරීම | ජාති, ජනවර්ග, සම්භවය, ආගම් හෝ වෙනත් තත්වයන් නොතකා සියල්ලන්ම සමාජීය, ආර්ථික හා දේශපාලන කටයුතුවලට සහභාගීත්වයබලගැන්වීම සහ දියුණු කිරීම | ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය ආගමික ස්ථාන 35 ක් අළුත්වැඩියා කිරීම - DAP | - | - | - |
| | | ආගමික ස්ථාන ගොඩනැගීම තුලින් සමාජ සමාජ සංහිදියාව ඇතිකිරිම. | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය මඟින් අධ්‍යාත්මික ක්‍රියාකාරකම් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම | - | - | - |
| | | | කර්මාන්ත හා වාණිජ, දීර්ඝ කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම්, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය මඟින් ආගමික ස්ථාන 10 ක ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු කිරීම සහ ග්‍රාමීය සංවර්ධන සමිති හා කාන්තා ග්‍රාමීය සංවර්ධන සමිති 58 ක් සඳහා ගෘහ භාණ්ඩ ලබාදීම | - | - | - |
| | | යහපත් ප්‍රජාවක් ගොඩනැගීම සඳහා සමාජීය, ආර්ථික හා ආගමික අංශ බලගැන්වීම සහ දියුණු කිරීම | මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය මඟින් ආගමික ස්ථාන 504 ක් අළුත්වැඩියා කිරීම | - | - | - |

## නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් තිරීම

නගරයන්හි ශීඝ්‍ර වර්ධනය ඉහල යන ජනගහනය සහ අධික සංක්‍රමණයන්ගේ ප්‍රතිඵලයක් වන අතර එය මහා නගර බිහිවීමට හේතුවී ඇත. එහිදී විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ මුඩුක්කු ජනාවාස නාගරික ජීවිතයේ සැලකිය යුතු අංගයක් බවට පත්ව තිබේ. තිරසර ලෙස නගර සකස් කිරීම යනු වෘත්තීය සහ ව්‍යාපාර අවස්ථා නිර්මාණය කිරීම, දැරිය හැකි මිලකට ආරක්ෂාකාරී නිවාස සැපයීම සහ ශක්තිමත් සමාජයන් හා ආර්ථිකයක් ගොඩනැගීමයි. එහිදී පොදු ප්‍රවාහනය හා හරිත පොදු අවකාශ නිර්මාණය සඳහා ආයෝජන කිරීම සහ සහභාගීත්ව හා පරිපූර්ණ ලෙස නගර සැලසුම් වැඩිදියුණු කිරීම සහ කළමනාකරණයද ඇතුලත්වේ.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| | තිරසර නගර සහ ප්‍රජාවන් | ගෝලීය සංස්කෘතික හා ස්වභාවික උරුමයන් ආරක්ෂා කිරීම හා සුරක්ෂිත කිරීමේ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම. | සංචාරක කටයුතු අමාත්‍යාංශය මඟින් තේක්කම්හි කුන්චුකුලම් එල්ලෙන පාලම අළුත්වැඩියා කිරීම | - | - | - |
| | | සැමටම ප්‍රමාණවත්, ආරක්ෂිත හා දැරිය හැකි මිලකට නිවාස පහසුකම් ලබාගැනීමේ ප්‍රවේශයන් සහතික කිරීම. | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය මඟින් නිවාස 1210 ක් ඉදිකිරීම | - | - | - |
| | | | මුදල්, ආර්ථික කටයුතු සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය මඟින් නිවාස 24 ක් අළුත්වැඩියා කිරීම | - | - | - |
| | | ජාතික හා ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් ශක්තිමත් කරමින් නාගරික, අර්ධ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ අතර ධනාත්මකආර්ථික, සමාජීය හා පාරිසරික සම්බන්ධතා සඳහා උපකාර කිරීම. | මුදල් අමාත්‍යාංශය මඟින් ප්‍රජා ශාලා ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම | - | - | - |

## තිරසර සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයන් ශක්තිමත් කිරීම හා ගෝලීය හවුල්කාරීත්වය පුනර්ජීවනය කිරීම

වත්මන්ලෝකය අන් කවරදාකටත් වඩා එකිනෙකට සම්බන්ධවී පවතී. තාක්ෂණය සහ දැනුම සඳහා වන ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම අදහස් බෙදාහදා ගැනීම සහ නව්‍යකරණය පෝෂණය කිරීමේදී වැදගත් මාර්ගයක්වේ. ඌණ සංවර්ධිත රාජ්‍යයන් වෙත ආයෝජන ලබාගැනීම ප්‍රවර්ධනය මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්ට ඔවුන්ගේ ණය කළමනාකරණය සඳහා උපකාරීවන ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීමද තිරසර වර්ධනය සහ සංවර්ධනය සඳහා ඉතා වැදගත්වේ. ඉලක්ක සියල්ල සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම්වලට උපකාර කරමින් සහයෝගයන් වැඩිදියුණු කිරීම මෙම අභිමතාර්ථවල අරමුණවේ. ජාත්‍යන්තර වෙළඳාම් කටයුතු ප්‍රවර්ධනය සහ සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්ට ඔවුන්ගේ අපනයන වැඩිකර ගැනීමට උපකාර කිරීම ආදී සියල්ලක්ම සැමට ප්‍රතිලාභ හිමිවන, විවෘතවූද, සමානවූද ජාත්‍යන්තර රීති මත පදනම්වූ සාධාරණ වළඳ ක්‍රමයක් සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාවලියේ කොටස්වේ.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| | ඉලක්ක සඳහා සම්බන්ධතාව යන් | තිරසර සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයන් ශක්තිමත් කිරීම හා ගෝලීය හවුල්කාරීත්වය පුනර්ජීවනය කිරීම. | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යංශය මගින් ග්‍රාමීය ප්‍රවේශ ව්‍යාපෘති 5 ක් සම්පූර්ණ කර ඇත. | - | - | - |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග




ඉහත විස්තර කරන ලද එක් එක් ව්‍යාපෘතිය නිශ්චිත ව්‍යාපෘති කාලසීමාවන් ඇතුලත ක්‍රියාත්මක කිරීම තුලින් ප්‍රතිලාභීන් විසින් පහත ප්‍රතිලාභ අත්විඳිනු ඇත. රැකියා අවස්ථා සහ ආදායම් වැඩිකිරීම, දිළිඳුබව අවම කිරීම, ජීවන තත්වය වැඩිදියුණු කිරීම හා අභ්‍යන්තර මාර්ග සහ ප්‍රජා ශාලා අළුත්වැඩියා කිරීම.ජනතාවගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් ජීවනෝපාය මාර්ග උපකරණ සහ ණය මුදල් ලබාදී ඇත.




මරණය මෙන්ම ලෙඩ රෝග සඳහාද මූලික වන ප්‍රධාන හේතූන් රැසක් මර්දනයේලා අප විසින් විශාල ප්‍රගතියක් අත්කරගෙන ඇත. ආයු අපේක්ෂාව විශාල වශයෙන් ඉහල ගොස් ඇති අතර මාතෘ මරණ සහ ළමා මරණ අනුපාතයද අඩුවී ඇත. 2030 වර්ෂයේ න්‍යාය පත්‍රය මගින් මෙම සාධක දෙකෙහි අන්තර් සම්බන්ධතාවය සහ සංකීර්ත්වය පිළිඹිබු කරයි.




**පාසල් සංවර්ධන කටයුතු :**ගුණාත්මක අධ්‍යාපනයක් සැපයීමට යෝග්‍ය අධ්‍යාපනික පරිසරයක් නිර්මාණය කිරීමේ අදිටනින් ජාතික සමඟිය හා සංහිඳියා කාර්යංශය මගින්පාසලක සංවර්ධන කටයුතු සඳහා රු. මිලියන 0.9 ක ප්‍රතිපාදන වෙන්කර ඇත. ජාතික ඒකාබද්ධතා අමාත්‍යංශය විසින් පාසැල් අළුත්වැඩියා කිරීම මගින් යෝග්‍ය අධ්‍යාපනික පරිසරයක් සකස් කර ඇති අතර එමගින් ගුණාත්මක අධ්‍යාපනයකට රුකුලක් සැපයේ.




ජාතික ආර්ථිකයට දායක කර ගැනීමේ අදිටනින්, නැවත පදිංචි කිරීම් සිදුකළ ප්‍රදේශවල ජනතාවගේ මූලික අවශ්‍යතා සහ යටිතල පහසුකම් ලබාදී ඔවුන් සවිමත් කර ඇත. නැවත පදිංචි කිරීම් සිදුකළ පසුව එම අමාත්‍යංශය විසින් එම ජනතාවගේ ජීවන තත්වය ඉහල නැංවීම සඳහා වන ක්‍රියාකාරකම් වේගවත් කර ඇත. මෙම සෑම ව්‍යාපෘතියකම මූලික අරමුණ වන්නේ ජාතික ආර්ථිකයට දායක වීම සහ සහය වීමයි. එමගින් අප රටේ අනාගත ආර්ථික වර්ධනයට රුකුලක් ලැබෙනු ඇත. අවසානයේදී සෑම ව්‍යාපෘතියක්ම එමගින් අපේක්ෂිත අවශ්‍යතා සැපිරීම සහතික කරයි. ජල සම්බන්ධතා සැපයීම, ජලාශ ප්‍රතිසංස්කරණය සහ සාමාන්‍ය විවෘත ළිං සකස් කිරීම ආදිය දැරිය හැකි මිලක් වන සහ ආරක්ෂාකාරී වන පානීය ජලය වෙත ගෝලීය වශයෙන් සැමට ප්‍රවේශය සහතික කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට සහයක්වේ.




ජනගහනය වර්ධනය වීම මේ දක්වාම සිදුවන හෙයින්, ලාභදායී ඉන්ධන සඳහා වැඩි ඉල්ලුමක් පවතී.සූර්ය, සුළං සහ තාප බලශක්තිය යනාදිය සඳහා ආයෝජනය, බලශක්ති ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සහ සැමට බලශක්තිය ලැබීමට උපකාරීවේ.




ගෝලීය ආර්ථිකය ක්‍රමයෙන් නැවත යථා තත්වයට පත්වෙමින් තිබේ. වර්ධනය වන විශමතාවයන් දුරලීමට තරම් ප්‍රමාණවත් රැකියා අවස්ථා නොමැත. තිරසර සංවර්ධන ඉලක්ක (SDG) මගින් එම ඉලක්කද සමග පෝෂිත ආර්ථික වර්ධනය, ඉහල මට්ටමේ ඵලදායීතාවය සහ තාක්ෂණික නව්‍යකරණය යන කරුණු ප්‍රවර්ධනය කරන අතරම වර්ෂ 2030 වන විට ස්ත්‍රී පුරුෂ සැම අයකුටම සම්පූර්ණ සහ ඵලදායී රැකියාවක් හා යෝග්‍ය කාර්යයන් ලබාදීම සාක්ෂාත් කර ගැනීමේ ඉලක්කය මූලික කර මෙම කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි.




ග්‍රාමීය ප්‍රදේශ වෙත මනා ප්‍රවාහන පහසුකම් ලබාදී කුඩා පරිමාණයේ කර්මාන්ත සහ අනෙකුත් ව්‍යවසායන් සඳහා වන සම්බන්ධතාවයන් වර්ධනය කිරීම.තවද පොදු අවශ්‍යතා සඳහා වන ගොඩනැගිලි ඉදිකිරීම මගින්ද තිරසර හා සවිමත් යටිතල පහසුකම් සංවර්ධනයකට පහසුකම් සැලසේ.

යටිතල පහසුකම් සංවර්ධන කටයුතු, ක්‍රීඩා පිටි අළුත්වැඩියා කිරීම් (104), ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති, ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය (107) සහ ප්‍රජා ශාලා ඉදිකිරීම් තුලින් කර්මාන්ත, නව්‍යකරණය සහ යටිතල පහසුකම් යන අංශ වලට රුකුලක් ලැබේ.




ජාතික ඒකාබද්ධතා අමාත්‍යංශය මගින් ආගමික ස්ථාන 35 ක් අළුත්වැඩියා කර ඇති අතර මුදල් අමාත්‍යංශය මගින් ආගමික ස්ථාන 504 ක් අළුත්වැඩියා කර ඇත. මේ ආකාරයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අරමුණ වන්නේ සමාජ ඒකාබද්ධතාවය සහ සමාජ සංහිදියාව ගොඩනැගීමයි.




මන්නාරම දිස්ත්‍රික්කයේ සංචාරක කටයුතු සංවර්ධනය සඳහා රුකුලක් වන ලස සංචාරක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යංශ ය් දායකත්වයෙන් රු.මිලියන 2.37 ක මූල්‍ය ප්‍රතිපාදන යොදා ගනිමින් කුන්චුකුලම් එල්ලෙන පාලම අළුත්වැඩියා කිරීමේ කටයුතු සාර්ථකව අවසන් කර ඇත.




තිරසර සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයන් ශක්තිමත් කිරීම හා ගෝලීය හවුල්කාරීත්වය පුනර්ජීවනය කිරීමේ අරමුණ ශක්තිමත් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යංශය විසින් ග්‍රාමීය ප්‍රවේශ ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කර ඇත.

# 6. 06 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 34 | 28 | 06 |
| තෘතීයික | 19 | 04 | 15 |
| ද්විතීයික | 543 | 388 | 153 |
| ප්‍රාථමික | 68 | 38 | 30 |
| **එකතුව** | **664** | **458** | **204** |

## 6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා තනතුරු දෙකක් සහ ප්‍රදේශීය ලේකම් කාර්යාල සඳහා තනතුරු පහක්ද බැගින් තාක්ෂණ නිලධාරී තනතුරු හතක් අනුමත කර තිබුණද මේ වන තෙක්ම කිසිදු තාක්ෂණ නිලධාරියකු අනුයුක්ත කර නොමැත. ඇස්තමේන්තු සකස් කිරීම, වැඩ අධීක්ෂණය, ටෙන්ඩර් පටිපාටි සහ බිල්පත් සකස් කිරීම ආදී සියළු කටයුතු තාක්ෂණ සහායකයින්ගේ සහය මත දිස්ත්‍රික් ඉංජිනේරුවරයා විසින් ඉටු කරනු ලබයි. මෙසේ කාර්යයන් රාශියක් ඉටුකිරීම හේතුවෙන් එහි ප්‍රතිඵලයක් ලෙස එක් එක් සංවර්ධන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සහ නිරීක්ෂණය කිරීමේ කටයුතු නියමිත කාල රාමුව තුල ඉටුකිරීමේදී විශාල රාජකාරි ප්‍රමාණයක් එක්රැස්වී ඇත.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රදේශීය ලේකම් කාර්යාල සඳහා සිංහල - දෙමළ භාෂා පරිවර්තක නිලධාරී තනතුරු හයක් අනුමත කර තිබුණද මේ වන තෙක්ම කිසිදු භාෂා පරිවර්තක නිලධාරියකු අනුයුක්ත කර නොමැත. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රදේශීය ලේකම් කාර්යාලවල කාර්ය සාධනය සහ ඵලදායිතාව වර්ධනය සඳහා සිංහල - දෙමළ භාෂා පරිවර්තක නිලධාරීන් අත්‍යවශ්‍ය වන අතර එය සේවාලාභීන්ගේ තෘප්තියට රුකුලක් වනු ඇත.

- කාර්යාල සේවක සේවයේ තනතුරු දහතුනක් අනුමත කර තිබුණද දැනට එම තනතුරේ නව දෙනකු පමණක් අනුයුක්ත කොට ඇත. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන ඒකක 20 හි කාර්ය සාධනය සහ ඵලදායිතාව වර්ධනය සඳහා කාර්යාල සේවක සේවයේ සේවකයින්ගේ සහය අත්‍යවශ්‍යවේ.

## 6.3. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු '000) | | වැඩ සටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | **දේශීය** | **විදේශීය** | | |
| විශ්‍රාම වැටුප් සංශෝධනය | 25 | දින 02 යි | 34,747 | - | දේශීය | විශ්‍රාම වැටුප් සංශෝධනය පිළිබඳ දැනුම වර්ධනය |
| මහජන සම්බන්ධතා නිලධාරීන් සඳහා පුහුණුව | 35 | දින 01 යි | 9,500 | - | දේශීය | මහජන සම්බන්ධතා පිළිබඳ දැනුම වර්ධනය |
| ලිපිගොනු කළමනාකරණ ය | 80 | දින 02 යි | 24,560 | - | දේශීය | ලිපිගොනු කළමනාකරණය පිළිබඳ දැනුම වර්ධනය |
| ආයතන කාර්ය පටිපාටි සහ මුදල් රෙගුලාසි | 41 | දින 01 යි | 18,120 | - | දේශීය | ආයතන කාර්ය පටිපාටි සහ මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම වර්ධනය |
| අභ්‍යන්තර විගණන හැකියා පුහුණු වැඩසටහන | 01 | දින 05 යි | 12,500 | - | දේශීය | අභ්‍යන්තර විගණන පාලනය පිළිබඳ දැනුම වර්ධනය |

## 7. 07 වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | - | - |
| 1.6 | වෙනත් | අදාල නොවේ | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014-05-11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීම | අනුකූල නොවේ | ජීවනෝපාය ආධාර සම්බන්ධ දත්ත එක්රැස් කිරීම ප්‍රමාද වීම | මෙවන් ප්‍රමාදයන් වලක්වා ගන්නා ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇත |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | - | - |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | - | - |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච් ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබද තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය, ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂිකභාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 9 | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| 9.5 | 2016-12-29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | - | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | - | - |
| **10** | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අදාල නොවේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයත් ඇතුලත නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | අදාල නිලධාරියාට එරෙහිව අධිකරණයේ නඩු පවරා ඇත. | අනාගතයේදී මෙවන් දෝශ ඇති නොවන ලෙස කටයුතු කළ යුතු බවට අදාල නිලධාරීන්ට දැඩි ලෙස උපදෙස් ලබාදී ඇත. අභ්‍යන්තර පරීක්ෂා කිරීම් සහ අභ්‍යන්තර පාලනය දැඩිව ක්‍රියාත්මක කර ඇත. |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසාන ය් දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලැඹීම | අනුකූල වේ | - | - |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ නිල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | සේවයෙන් ඉවත් කිරීම සහ වැඩ තහනම් කිරීම | ආපසු අය කර ගැනීම සඳහා පියවර ගෙන ඇත. |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසදුම් කිරීම. | අනුකූල වේ | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදු කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | - | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයාට වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 16.3 | 20-09-2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබද තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබද මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018-01-24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 19.4 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබද වගකීම් පවරා ජ්‍යෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට කර තිබීම. | අනුකූල වේ | - | - |